ඌව පළාත් ... සමාජ සුභ සාධන අමාත්‍යාංශයේ

සමාජ සේවා තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය

දෙවන ශ්‍රේණියේ සමාජ සේවා නිලධාරී තනතුර

01. වැටුප් පරිමාණය:- මෙම තනතුර සඳහා 27420-9×660-8×870, 39600/= වර්ෂයකට රු. 34920 වැටුප්පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ. මේ සඳහා මෙහි උපග්‍රන්ථයෙහි නියමිත පරීක්ෂණය සමත් විය යුතුය.

02. වයස් සීමාව:- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවු: 40 ට නොවැඩි විය යුතුයි. (රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.)

03. අධ්‍යාපන සුදුසුකම්:-

(අ). පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබීම

හෝ

(ආ). අ.පොස (උ.පෙ.) විභාගයේ එකම අවස්ථාවකදී විෂයයන් හතරක් (04) සාමාර්ථය ලබා තිබීම සහ ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ඇ). අ.පො.ස.(උ.පෙ.) විභාගයේ එකම අවස්ථාවකදී විෂයයන් හතරකින් (04) සමත්වීම අනතුරුව රජයේ නිලධාරියෙකු වශයෙන් හෝ රාජ්‍ය සංස්ථාවක නිලධාරියෙකු වශයෙන් හෝ පටන් පිරිසෙන් අවුරුදු 07 ක අඛණ්ඩ පළපුරුද්දක් ලබාතිබීම සහ

හෝ

(ඈ) 1. විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන්

හෝ

2. විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයක් සිංහල/දෙමළ භාෂාව සහ අංක ගණිතය/ගණිතය, ව්‍යවහාරික ගණිතය/වාණිජ ගණිතය යන විෂයයන් දෙකක සහිතව, එක වරකට විෂයයන් 05ක් අනුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් (06) අ.පො.ස.(සා.පෙ.) විභාගයෙන් සමත්වීම අනතුරුව රජයේ නිලධාරියෙකු හෝ රාජ්‍ය සංස්ථාවක නිලධාරී-යෙකු වශයෙන් පටන් පිරිසෙන් අවුරුදු 10 ක අඛණ්ඩ පළපුරුද්දක් ලබා තිබීම.

04. බඳවා ගැනීමේ ක්‍රමය :- රාජ්‍ය [illegible] විශ්‍රාම විධිවිධාන ප්‍රකාශ 15/90, 15/90(1) ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින්.

05. බඳවා ගැනීමේ කොන්දේසි :- (I). මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(II). ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සේවා කොන්දේසි මත පත්වීම් කරනු ඇත.
(III). තෝරා ගනු ලබන සෑම නිලධාරියෙකු/නිලධාරිනියක ගෙවීම වැන්දඹු, අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

සේවා කොන්දේසි :- (I). ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 12:1 හා 12:6 සිට 12:10 දක්වා වගන්ති අදාල වේ.

## පළමුවන පන්තියේ සමාජ සේවා නිලධාරී තනතුර උසස් කිරීම

01. වැටුප් පරිමාණය :- වර්ෂයකට රු. 34920-13x780-45060 වේ. රු. 39600/= ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 37/92 අනුව) රාජකාරියට පැමිණීම, පැවතීම, රාජකාරි ඉටුකිරීම යන කරුණුවලට සතුටුදායක තත්ත්වය සලකා බලා මෙම කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

02. වයස් සීමාව :- වයස් සීමාව අදාල නොවේ.

03. අධ්‍යාපන හා වෙනත් :- (I). දෙවන පන්තියේ සමාජ සේවා නිලධාරී හෝ සමාජ සේවා සහයක සහ දෙවන පන්තියේ සමාජ සේවා නිලධාරී යන තනතුරු දෙකේම හෝ අවු: 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
(II). දෙවන පන්තියේ සමාජ සේවා නිලධාරී තනතුර සඳහා උපග්‍රන්ථයේ නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් දෙවන පන්තියේ සමාජ සේවා නිලධාරියෙකු වීම.

04. බඳවා ගැනීමේ ක්‍රමය :- නියමිත සුදුසුකම් ලබා ඇති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/91 අනුව තෝරා ගනු ලැබේ.

05. සේවයට බඳවා ගැනීමේ කොන්දේසි :- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.

පි. 03 ට .......

06. සේවා කොන්දේසි :- ආයතන සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ 10:12, 12:5 සිට 12:13 සහ 12:15 වගන්ති අදාළ වේ.

## උපග්‍රන්ථය

## සමාජ සේවා නිලධාරීන් සඳහා බඳවා ගැනීමේ පරිපාටියානුකූලව ස්ථිර කිරීමට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. දෙවන පන්තියේ සමාජ සේවා නිලධාරී තනතුරේ ස්ථිර කිරීම සඳහා පරීක්ෂණය

මෙම පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වෙයි.

(I). රාජ්‍ය පරිපාලන රෙගුලාසි: (මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහ, භාණ්ඩාගාර චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ)
ප්‍රශ්න පත්‍ර 01 යි. පැය 02 යි. ලකුණු 100 යි.

(II). සමාජ සේවා ව්‍යවස්ථා සහ සුබ සාධක සේවාවන් (ප්‍රශ්න පත්‍ර 01 යි. පැය 02 යි. ලකුණු 100 යි)

(III). දෙවන භාෂාව:- සිංහල/දෙමළ
(අ) වාචික පරීක්ෂණය (මිනිත්තු 15)
පරීක්ෂණයෙන් සමත්වීම සඳහා වාචික පරීක්ෂණයෙන් ලකුණු 40% ක් ලැබිය යුතුව ඇත.

02. දෙවෙනි පන්තියේ සමාජ සේවා නිලධාරීන් සඳහා රු.34920/= වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය. මෙම පරීක්ෂණය පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විතය.

---

(I). සමාජ විද්‍යාව (ප්‍රශ්න පත්‍ර 01 යි. පැය 03 යි. ලකුණු 100 යි)
(II). මනෝ විද්‍යාව (ප්‍රශ්න පත්‍ර 01 යි. පැය 03 යි. ලකුණු 100 යි)
(III). ආර්ථික විද්‍යාව (ප්‍රශ්න පත්‍ර 01 යි. පැය 03 යි. ලකුණු 100 යි)
(IV). සමාජ සුබ සාධක ප්‍රතිපත්ති හා පරිපාලන (ප්‍රශ්න පත්‍ර 01 යි. පැය 03 යි. ලකුණු 100 යි)

සටහන :-

1. සමත්වීම සඳහා සෑම විෂයයකින්ම 40% කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් මැගින් ලබා ගත යුතුය.
2. සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, ආර්ථික විද්‍යාව, විෂයයන් සම්බන්ධයෙන් අ.පො.ස. (උ.පෙ.) විභාගයට ඉහළ තත්ත්වයකට බලාපොරොත්තු වනු ලැබේ. පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධි යෝග්‍යතා විධිමත්ව මෙහි සඳහන් යම් විෂයයක් සමත්ව ඇති අය අදාළ විෂයයන් නිදහස් කිරීමට හැකිය.

/04 වි ......

3. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පිළිගනු ලබන සමාජ සේවා සම්බන්ධ [illegible] ඩිප්ලෝමා සහතිකයක් ලබා ඇති අය යම් විෂයයක් හෝ සම්පූර්ණ පරීක්ෂණයෙන් නිදහස් කළ හැකිය.

4. II පන්තියේ සමාජ සේවා නිලධාරී තනතුරක අවුරුදු 10 ක් සේවය කිරීම හෝ අවුරුදු 45 ට එළඹීම යන කරුණු වලින් පසුව එළඹෙන අවස්ථාවේදී නිලධාරියාගේ වැඩ පැවරීම හා හැසිරීම පරීක්ෂා කර බලා ඔවුන්ගේ වැටුප් ක්‍රමයේ රු. 34920/= දක්වා ඇති කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් නිදහස් කිරීමට පත්වීම් බලධාරියාට බලය ඇත.

20/7/95

20/2001